**ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදි. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදි.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම.

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීනකර පවත්වා ගැනීම, ගිණුම පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුනි 12 දින පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4** **විගණන නිරීක්ෂණය**

**---------------------**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.18 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහි ලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ලේඛන හා පොත් පවත්වා නොතිබීම.<br>2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.<br>3. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම.<br>4. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.14<br>2.3(අ)<br>2.3(ආ)<br>2.3(ඇ) |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමට ද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමට ද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම.<br>2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්<br>3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු<br>4. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු<br>5. අවිධිමත් ගනුදෙනු | 2.3(අ)<br>2.3(ඇ)<br>2.4.1<br>2.10<br>2.5 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.<br>2. අනුකූල නොවීම් | 2.14<br>2.15 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම. | 2.12 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධි විධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදුවී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | පාඩු හා හානි | 2.6 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**-----------------------------------------------------**

**2.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------------**

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රජයේ ප්‍රධාන සම්බන්ධීකරණ ආයතනය වශයෙන් රජයේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුව ක්‍රියාත්මක කිරීම, ප්‍රගති සමාලෝචනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.

(ඇ) එක් එක් අවස්ථාවලදී පනවන ලද ව්‍යවස්ථාපිත අණපනත්වලින් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම.

(ඈ) ජනතාවගේ නීතිය හා සාමය පවත්වා ගෙන යාමටත්, ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, රජයේ ආරක්ෂක අංශ සමඟ සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම.

(ඉ) රජයේ විවිධ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශවල දිස්ත්‍රික්කයේ ප්‍රධාන නියෝජිත ආයතනය වශයෙන් ඔවුන්ගේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය කිරීම.

(ඊ) රජයේ ආදායම් ගණන්දීම සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරියා වශයෙන් රජයේ ආදායම් එකතු කිරීම හා ගිණුම්ගත කිරීමේ කටයුතුවල නිරත වීම.

**2.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන හා එමගින් ඉටු කළයුතු කාර්යභාරයයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ස්ථාපිත කර ඇති ආයතන හා ඒවායේ කාර්යභාරය පහත දැක්වේ.

<table>
<tr><th></th><th>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ආයතන</th><th>ස්ථාපිත කිරීමේ අධිකාරී බලය</th><th>කාර්යභාරය</th></tr>
<tr><td>(i)</td><td>වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td><td rowspan="15">1992 අංක 58 දරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේ පනත</td><td rowspan="16">ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ස්ථාපිත කර ඇති, ආයතන හා පාලන අංශය, ඉඩම් අංශය, ගිණුම් අංශය, රෙජිස්ට්‍රාර් අංශය, සමාජ සුභසාධන හා සංවර්ධන අංශය, දිවිනැගුම අංශය හා සැලසුම් හා සංවර්ධන යන අංශයක් හරහා ප්‍රදේශයේ සේවාලාභී මහජනතාව අපේක්ෂා කරනු ලබන විවිධ කාර්යයන් ඉටුකිරීම හා ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත ලිඛිත නීතියක් මඟින් හෝ වෙන්කර දෙන ලද යම් බලයක් කාර්යයක් හෝ කර්තව්‍යයක්, ඒ කොට්ඨාශය ඇතුළත ඉටු කිරීම.</td></tr>
<tr><td>(ii)</td><td>නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(iii)</td><td>දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(iv)</td><td>මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(v)</td><td>මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(vi)</td><td>හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(vii)</td><td>ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(viii)</td><td>මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(ix)</td><td>පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(x)</td><td>මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(xi)</td><td>කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(xii)</td><td>කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(xiii)</td><td>පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(xiv)</td><td>ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(xv)</td><td>වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td></tr>
<tr><td>(xvi)</td><td>නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</td><td></td></tr>
</table>

**2.3 කාර්යභාරයන් ඉටුනොකිරීම**

(අ) **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

රු.මිලියන 1.97 ක ගිවිසුම්ගත වටිනාකමකට ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කර තිබූ බුරුතකැලේ ගම්පහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම, විජය කටුපොත ඇලෙන් එගොඩ පාර කොන්ක්‍රීට් කිරීම, බංගදෙනිය කුම්බුටුකුලිය මාර්ගය කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම සහ දිගන්වැව මාර්ගය කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම යන ව්‍යාපෘති වල අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබාගැනීමෙන් තොරව අදාල ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

(ආ) **අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

---------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2014 වර්ෂයේ ආරම්භ කර තිබූ කම්මන්දළුව පානීය ජල ව්‍යාපෘතිය හා පුලියන්කුලම ජල ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 2.6 ක ප්‍රතිපාදන වැය කර තිබූ නමුත්, අදාල ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 30 ක් පමණ වීම නිසා එමඟින් සේවාලාභී මහජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි.

(ii) ආරච්චිකට්ටුව මානවේරිය ප්‍රදේශයේ ඉදිකරමින් පැවති ගිමන් හල් භූමිය වටා ග්‍රිල් වැටක් හා දැල් වැටක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු. මිලියන 6.19 ක් වැයකර තිබුණි. ඉදි කර තිබුණු වැටේ පහල කොටස සහ පොළව අතර අඩි 03 ක පමණ පරතරයක් පැවති අතර මෙම පරතරය පස් දමා පිරවීමකින් තොරව වැට ඉදිකර තිබුණි.

(iii) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත කල්පිටිය කීරිමුන්දලම ප්‍රදේශයේ නිවාස 50 කින් යුතු ධීවර ගම්මානයක් ඉදිකිරීම සඳහා එක් නිවසකට රු. 300,000 ක් බැගින් තක්සේරු කර රු. මිලියන 15 ක ප්‍රතිපාදන මුදලක් ලබා දී තිබුණි. ව්‍යාපෘතියේ එක් නිවසක පිරිවැය රු. 554,113 ක් වී තිබූ අතර, ඉතිරි මුදල වන රු. 254,113 ක මුදල අදාල ප්‍රතිලාභීන්ට දැරීමට නියම කර තිබූ නමුත්, ඒ සඳහා ඔවුන්ට මූල්‍ය ශක්තියක් නොතිබුණි. 2017 නොවැම්බර් 06 දින වනවිට වැඩ අවසන් කිරීමට සැලසුම් කර තිබුණද අදාල සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට හැකියාව ලැබී නොතිබුණි. තවද, අදාල නිවාස ප්‍රතිලාභීන් ප්‍රදේශයේ ධීවර කටයුතුවල නිරතවන්නන්ද යන්න තහවුරු කර ගැනීමට ද නොහැකි විය.

(iv) රු.මිලියන 30.0 ක ඇස්තමේන්තුවක් මත 2014 ඔක්තෝබර් 07 දින වනවිට ඉදිකිරීමට නියමිතව තිබූ ආනමඩුව රංග ශාලාව 2018 ජුනි 12 දින වනවිට රු.මිලියන 22.2 ක් වැය කර තිබුණද එහි ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(v) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ රු. මිලියන 12.7 ක ප්‍රතිපාදන මත ඉදිකිරීම් අවසන් කර තිබූ කල්පිටිය බස් නැවතුම්පලද, සංචාරක අමාත්‍යාංශයේ රු. මිලියන 52.7 ක ප්‍රතිපාදන වැයකර ඉදිකර තිබූ මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය ද, රු.මිලියන 14 ක ප්‍රතිපාදන වැයකර ඉදිකර තිබූ කල්පිටිය සති පොළද යන ව්‍යාපෘතිවල වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගෙන හෝ වැඩ අවසන් කර නොතිබූ බැවින්, නිශ්කාර්ය වියදම් බවට පත්වී තිබුණි.

(ඇ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 5 ක් ඉටුකිරීම සඳහා රු.මිලියන 4.36 ක ඇස්තමේන්තු කර තිබුණි. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමිතියෙන් යුත් අමුද්‍රව්‍ය ලබාගැනීමට නොහැකි වීම හා අයහපත් කාලගුණ තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපෘති නිමකිරීමට දින 07 ක සිට මාස 2 ½ දක්වා පරාසයක කාල පමාවකින් පසු සිදුකර තිබුණි.

**2.4 වත්කම් කළමනාකරණය**

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

-----------------------------------------

හලාවත සහ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ අනාරක්ෂිතව ගාල්කර තිබීම නිසා අදාල වාහනවල ආරක්ෂාව පිළිබඳව ගැටළු මතු වී තිබුණි.

**(ආ) රජයේ වත්කම් අවභාවිතා කිරීම**

--------------------------------

මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 598, කොන්තාන්තිව් ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 31.401 ක් වූ රජය සතු ඉඩම දීර්ඝ කාලයක සිට එක් පුද්ගලයෙක් අනවසරයෙන් අල්ලා ගෙන සංවර්ධන කටයුතු සිදුකර තිබුණි.

**(ඇ) රජයේ වත්කම්වල වටිනාකම හා ගුණාත්මකභාවය අඩුවීම**

----------------------------------------------------------

නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැරණි ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා එකී ගොඩනැගිල්ල විනාශ වෙමින් පැවතුණි.

**(ඈ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 10 ක් වසර 3 කට වැඩි කාලයක සිට භාවිතා නොකර නිෂ්කාර්යව දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගාල් කර තිබුණි.

**(ඉ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

--------------------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් ආයතන මඟින් ලබාදී තිබූ කැබ් රථයක්, ලොරි රථයක් සහ බව්සර් රථයක් විධිමත්ව පවරා ගැනීමකින් තොරව භාවිතා කර තිබුණි.

**2.5 අවිධිමත් ගනුදෙනු**

--------------------

2017 වර්ෂයේ දී මහකුඹුක්කඩවල කවයන්කුලම ග්‍රාමයේ සමූහ ප්‍රජා මූල සංවිධානය සඳහා නළළිඳක් ඉදිකර තිබුණි. මෙම ළිදේ ජලයේ ප්‍රමිතිය පිළිබඳ පරීක්ෂා කිරීමෙන් තොරව රු.334,675 ක් ගෙවා වතුර මෝටර් සහ උපාංග මිලදී ගැනීමෙන් පසුව ජලය ප්‍රමිතියෙන් තොර බව අනාවරණය වීම නිසා මිලදී ගෙන තිබූ ඉහත වතුර මෝටරය හා උපාංග 2017 දෙසැම්බර් 31 දින වනවිටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

## 2.6 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහනයක් රියදුරුගේ අපරික්ෂාකාරී ධාවනය නිසා අනතුරකට ලක්වී තිබූ බවට අනාවරණය වී තිබුණත්, තක්සේරු කර තිබූ අලාභය රු.180,500 ක මුදල අදාල රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014, 2015 හා 2016 වර්ෂවල සිදුවී තිබූ රු.599,429 ක් වූ අලාභ හානි 03 ක මූලික පරීක්ෂණවලින් අදාල රියදුරන් වගකිව යුතු බවට නිර්දේශ කර තිබූ නමුත්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ඒ සඳහා නොලැබීම හේතුවෙන් අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය | ඌනතාවය කෙටියෙන් |
|---|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | | |
| 2016 | 3.12 (ආ) | නවගත්තේගම රංග ශාලාව | අරමුණු සඳහා යොදා නොගැනීම |
| 2016 | 3.15 (අ) | ආණමඩුව රංග ශාලාව අදියර I | වැඩ අතරමඟ නවතා තිබීම |

## 2.8 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට දීර්ඝ කාලයක් ගතකර තිබුණි.

(ආ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම්, නියමානුකූල කිරීම් හා දීර්ඝ කාලීනව බදුදීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අදාල ලිපිගොනු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර තිබූ නමුත් මෙම ගැටළුව 2018 ජුනි 12 දින වන විටත් විසඳා නොතිබුණි.

(ඇ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි අක්කර 81 රූඩ් 03 පර්චස් 38 ක වපසරියකින් යුත් ගොවිපල ඉඩමක් 1995 වසරේ සිට අනවසරයෙන් භුක්ති විඳින අතරම අවස්ථා කිහිපයක දීම ව්‍යාජ ඔප්පු සකසා ඉඩමේ කොටස් විකුණා තිබුණි. අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හෝ 2013 ජනවාරි 12 දිනැති අංක 4/10/4/3/0 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපියෙන් සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ හෝ ක්‍රියාකරන ලෙස දක්වා තිබුණද, ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන් සක්‍රීයව ක්‍රියාකර නොතිබුණි.

(ඇ) දංකොටුව ග්‍රාමීය මාර්ග සඳහා තාර දැමීමේ ව්‍යාපෘතිවලදී ඇස්තමේන්තුගත පළලට තාර දමා නොතිබූ අතර බොහෝ අවස්ථාවල ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි.

(ඉ) ආරච්චිකට්ටුව, ආණමඩුව සහ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ව්‍යාපෘති සඳහා හිමිකම් පරීක්ෂණය පැවැත්වීමට ප්‍රමාද වීම සහ වන්දි ප්‍රදානය කල දිනයන් අතර, දීර්ඝ කාල පරාසයක් ගැනීම නිසා වන්දිලාභීන්ට පොලී වශයෙන් එකතුව රු.20,012,831 ක මුදලක් ගෙවීමට තිබුණි.

(ඊ) පුත්තලම - පැලියගොඩ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මූලික පිඹුරු අංක 3707, 3708 හා 3727 ට අදාල ඉඩම් කැබලි 13 ක් සඳහා වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම නිසා රු.688,537 ක පොලී වශයෙන් අතිරේක පිරිවැයක් දැරීමට රජයට සිදුව තිබුණි.

(උ) හදිසියේ මියගොස් තිබූ රජයේ නිලධාරීන්ට අයත් බාල වයස්කරුවන්ගේ වයස සම්පූර්ණව පැවතියද රු.1,866,517 ක් වූ බැංකු ගිණුම් පොත් 06ක් සහ වයස තහවුරු කල නොහැකි වූ රු.947,754 ක් වූ බැංකු ගිණුම් පොත් 03 ක් අදාල හිමිකරුවනට භාර නොදී දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා ගෙන තිබුණි.

(ඌ) මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණන විමසුම් සඳහා නොපමාව පිළිතුරු ලබා දියයුතු වුවත්, 2016 අප්‍රේල් 06 දිනැති අංක NWP/PT/A/3,4/ආණ.ප්‍රා.ලේ/2017 පෙත්සම් පරීක්ෂාව/2017/575 දරන ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 649, කොට්ටුකච්චිය ග්‍රාම නිලධාරී වසමේ ඉඩමකට අයථා ලෙස බලපත්‍ර ලබාදීම සම්බන්ධව නිකුත් කර තිබූ විගණන විමසුමට 2018 ජුනි 30 දින වනවිටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

(එ) රාජකදළුව මානවේරිය ඊශ්වර කෝවිලේ වැසිකිළි පද්ධතියක් රු.මිලියන 3.77 ක් වැය කර පෞද්ගලික ඉඩමක ඉදිකිරීම සිදුකර තිබුණි.

**2.9 විගණන සාක්ෂි නොවීම**

1996 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු වී තිබූ වාහන අනතුරු 25 කට අදාල ලිපිගොනු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නොතිබූ බැවින්, රු.මිලියන 2 ක් වටිනාකම වූ අලාභ හානී පිළිබඳ සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2.10 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

ප්‍රතිලාභීන් වෙත ලබාදීමට විවිධ ප්‍රතිපාදන යටතේ ලැබී තිබූ දියර ඉසින යන්ත්‍ර, පෙර පාසල් ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩා උපකරණ තොගයක් ප්‍රතිලාභීන් වෙත ලබා දීමෙන් තොරව නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගබඩාවේ වසර ගණනාවක සිට රඳවා ගෙන තිබුණි.

**2.11 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| -------- | ------------- | ---------------- | ------------- | --------- | ----------------- |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 502.96 | 501.95 | 1.01 | 0.20 |
| | මූලධන | 63.20 | 61.43 | 1.77 | 2.80 |
| | **එකතුව** | **566.16** | **563.38** | **2.78** | **0.49** |
| 2014 | පුනරාවර්තන | 488.23 | 483.97 | 4.26 | 0.87 |
| | මූලධන | 38.40 | 37.44 | 0.96 | 2.50 |
| | **එකතුව** | **526.63** | **521.41** | **5.22** | **0.99** |
| 2015 | පුනරාවර්තන | 627.65 | 621.73 | 5.92 | 0.94 |
| | මූලධන | 57.30 | 57.25 | 0.05 | 0.08 |
| | **එකතුව** | **684.95** | **678.98** | **5.97** | **0.87** |
| 2016 | පුනරාවර්තන | 649.64 | 644.80 | 4.84 | 0.74 |
| | මූලධන | 75.00 | 64.33 | 10.67 | 14.22 |
| | **එකතුව** | **724.64** | **709.13** | **15.51** | **2.14** |
| 2017 | පුනරාවර්තන | 642.14 | 640.57 | 1.57 | 0.24 |
| | මූලධන | 95.00 | 92.50 | 2.50 | 2.63 |
| | **එකතුව** | **737.14** | **733.07** | **4.07** | **0.55** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**
**-----------------------------------------------------------------------------------------------------------**

වෙනත් අමාත්‍යාංශ 31 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 3,778 ක් හා රු.මිලියන 193 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,971 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 3,050 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 921 ක් හෙවත් සියයට 23 ක ප්‍රතිපාදන

ඉතිරි වී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මඟින් ලබාදී තිබූ පුනරාවර්තන වියදම් සඳහා වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 32 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉතිරි කර තිබුණි. ඒ අනුව ලැබී තිබූ ප්‍රතිපාදන නියමිත අරමුණ කරා මෙහෙයවා නොතිබුණි.

(ආ) ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ලබාදී තිබූ රු.3,600,000 මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ඇ) ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 2,381 ක් ලැබී තිබූ නමුත්, අදාල ප්‍රතිපාදනය සඳහා භාණ්ඩාගාරය විසින් රු.මිලියන 1,553 ක අග්‍රිමය මුදාහැර තිබුනේ සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුවේය. ඒ අනුව ප්‍රාග්ධන ප්‍රතිපාදන ආර්ථික වශයෙන් ඵලදායීව හා සකසුරුවම්ව යෙදවීම සඳහා ප්‍රමාණවත් කාලයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලැබී නොතිබුණි.

**2.12 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.2,212,072 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**2.13 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 02 ක් ඉක්ම වූ පුත්තලම, දංකොටුව, වනාතවිල්ලුව කල්පිටිය සහ මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.මිලියන 2.44 ක් වූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.14 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) | පවත්වා නොතිබුණි. |
| ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | පවත්වා නොතිබුණි. |

| | | |
|---|---|---|
| ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | සංග්‍රහයේ 2.11.2 | |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) | යාවත්කාලීන කර නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක I AI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 | යාවත්කාලීන කර නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | යාවත්කාලීන කර නොතිබුණි. |
| ණය ලේඛනය | මුදල් රෙගුලාසි 485 | යාවත්කාලීන කර නොතිබුණි. |

**2.15 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| | VII වන පරිච්ඡේදයේ 10 උප වගන්තිය | නිලධාරීන්ගේ සති අන්තයන්හි හා රජයේ නිවාඩු දිනවල නිවාඩු දින සේවය සඳහා කරුවලගස්වැව, කල්පිටිය, පුත්තලම හා නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දීප ව්‍යාප්ත සේවාවල සේවය කරන නිලධාරීන් වසර 05 කට වඩා එකම සේවා ස්ථානයක සේවය කර ඇත්නම් ඔවුන් ස්ථාන මාරුවීම් සඳහා යටත්විය යුතු වුවත්, මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 07 දෙනෙකු සම්බන්ධව උක්ත විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ඇ) **ජාතික අයවැය චක්‍රලේඛ**

| | |
|---|---|
| 2013 ජුලි 07 දිනැති අංක BD/GPS/130/9/14 MC -11 දරන හා 2016 ජනවාරි 06 දිනැති අංක BD/GPS/ 130/9/14/MC-ii දරන ජාතික අයවැය අධ්‍යක්ෂගේ ලිපි | යතුරුපැදි ලැබූ ක්ෂේත්‍ර නිලධාරියෙකු යතුරු පැදි හිමිකම් නොලබන තනතුරකට මාරුවී යාමේදී අදාල යතුරු පැදියේ වෙළඳපල වටිනාකම ගෙවිය යුතු වුවත්, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය උක්ත විධි විධාන ක්‍රියාත්මක කර නොතිබුණි. |

(ඈ) **වෙනත් චක්‍රලේඛ**

| | |
|---|---|
| 1999 අප්‍රේල් 09 දිනැති අංක 1/99 දරන දිස්ත්‍රික් පාලන චක්‍රලේඛය | සේවක ඇප තැන්පත් ලබාගැනීමේ දී අවම වශයෙන් එක් නිලධාරියෙකුගෙන් රු.1,000 ක තැන්පත් මුදලක් ලබාගැනීමට නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. |

## 2.16 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් තම දෙපාර්තමේන්තුවේ මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බව මුදල් රෙගුලාසි 133 මඟින් අවධාරණය කර තිබුණි.

පිළියෙල කර තිබූ අභ්‍යන්තර විගණන වැඩසටහනෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි වර්ෂයකට අවස්ථා 02 බැගින් විගණනය සිදුකිරීමට සැලසුම් කර තිබූ නමුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක 2017 වර්ෂයට අදාලව කිසිදු විගණනයක් සිදුකර නොතිබූ අතරම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක වර්ෂයකට එක් අවස්ථාවක් පමණක් විගණනයට භාජනය කර තිබූණි.

## 2.17 මානව සම්පත් කළමනාකරණය

**අනුමත කාර්යය මණ්ඩලය, තථ්‍ය කාර්යය මණ්ඩලය හා පුද්ගල පඩි නඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යයන් ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 571 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.376,763 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | '6 | 65 | 11 | - |
| (ii) | තෘතියික මට්ටම | ·2 | 16 | 26 | - |
| (iii) | ද්විතියික මට්ටම | 572 | 1283 | 289 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 143 | 32 | - |
| (v) | වෙනත් (අනියම්, තාවකාලික | '8 | 09 | - | 01 |

| | | | | |
|---|---|---|---|---|
| කොන්ත්‍රාත් පදනම මත) | ------ | ------- | ------ | -------- |
| එකතුව | 873 | 1516 | 358 | 01 |
| | === | ==== | == | == |

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විධිමත් අනුමැතියකින් තොරව අනුමත සංඛ්‍යාව ඉක්මවා අනියම් පදනම මත සේවකයෙක් බඳවා ගෙන තිබුණි.

## 2.18 මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරාදීම

මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව අභ්‍යන්තර පාලනය සහතික වන පරිදි තම නිලධාරීන් වෙත බලතල හා අධිකාරිය පැවරිය යුතු වුවත්, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිගාස් පරිගණක වැඩසටහන, පඩිපත් සැකසීම, බැංකු සැසඳුම් පිළියෙල කිරීම එක් නිලධාරියෙකු වෙතත් සරප් රාජකාරිය හා ගබඩාව භාරව කටයුතු කිරීම තවත් එක් නිලධාරියෙකු වෙතත් පවරා දී තිබුණි.